# පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය
## பாராளுமன்றச்சபைமுதல்வரின் அலுவலகம்
## OFFICE OF THE LEADER OF THE HOUSE OF PARLIAMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| දිනය<br>திகதி<br>Date | 2022.10.11 | මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | LHP/PA/01-2023 Budget | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | |

සියලුම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්
අනෙකුත් විශේෂ වියදම් ඒකක ප්‍රධානීන්

<u>ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම</u>
<u>අයවැය කාරක සභා අවස්ථාව - 2023</u>

2023 අයවැය කාරක සභා අවස්ථාවේ දී ගරු මන්ත්‍රීවරුන්ගේ පරිශීලනය සඳහා සෑම කැබිනට් අමාත්‍යාංශයක්ම සහ සෑම විශේෂ වියදම් ඒකකයක් විසින්ම 2022.09.30 දිනට ප්‍රගති වාර්තාව භාෂාත්‍රයෙන්ම (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) සකස් කළ යුතු වේ. එක් එක් අමාත්‍යාංශය විසින් තම අමාත්‍යාංශයේ විෂයපථයට අයත් සියලු දෙපාර්තමේන්තු, සංස්ථා හා අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩල වල උක්ත කාලය සඳහා ප්‍රගතිය තම වාර්තාවේ ඇතුළත් කළ යුතු ය.

අයවැය කාරක සභා අවස්ථාවේ දී පැන නැගිය හැකි කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් මුද්‍රිත පිටපත් 12 ක් සකස් කර ඉදිරිපත් කළ යුතු අතර මෘදු පිටපත <u>pau@olhp.gov.lk</u> දරණ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත මේ සමඟ අමුණා ඇති උපදෙස් අනුගමනය කරමින් පාර්ලිමේන්තුව වෙත යොමු කළ යුතු වේ.

මෙම ප්‍රගති වාර්තා අමාත්‍යාංශ ලේකම්ගේ/ විශේෂ වියදම් ඒකක ප්‍රධානියාගේ අත්සනින් යුතුව සභානායක ලේකම් මඟින් පාර්ලිමේන්තුවේ මහ ලේකම් අමතනු ලබන ලිපියක් සමඟ **2022.11.04** දින හෝ ඊට ප්‍රථමයෙන් පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වමි.

රටේ පවතින වර්තමාන තත්ත්වය මත අවම පිරිවැයකින් මෙම ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි.

හර්ෂ විජේවර්ධන
පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්

දුරකථන : 0112-777448/467
ෆැක්ස් : 0112-777468
විද්‍යුත් ලිපිනය : <u>pau@olhp.gov.lk</u>

*ඇමුණුම*

1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය මත මෙම වාර්තා භාෂාත්‍රයෙන් වෙන් වෙන් ව *(සිංහල, දෙමළ, ඉංග්‍රීසි ලෙස)* සැකසූ PDF කරන ලද ගොනු 3 ක් ලෙස විද්‍යුත් පණිවුඩයේ ඇතුළත් කර තිබිය යුතු ය.

2. මුද්‍රිත පිටපත සකස් කර ඇති ආකාරයෙන්ම ඉහත PDF කරන ලද ගොනුව පැවතිය යුතු ය. *(පිටකවරයද සහිතව)*

3. PDF කරන ලද ගොනු අමාත්‍යාංශයේ නමින් නම් කර තිබිය යුතු අතර එහි අන්තර්ගත භාෂාව පැහැදිලිව හඳුනා ගැනීමට හැකි වන පරිදි තිබිය යුතු ය.

   උදා:

   (1)

   - Ministry of Health _S
   - Ministry of Health _T
   - Ministry of Health _E

4. විද්‍යුත් තැපැල යොමු කිරීමේදී එහි අන්තර්ගතයේ පහත දක්වා ඇති තොරතුරු සඳහන් කළ යුතු වේ.
   - අදාල අමාත්‍යාංශයේ/ විශේෂ වියදම් ඒකකයේ නම
   - වාර්තාවේ නම සහ වර්ෂය *(උදා: ප්‍රගති වාර්තාව - 2022)*
   - යම් පැහැදිලි කිරීමක් සිදු කිරීම සඳහා සම්බන්ධ කර ගත යුතු නිලධාරියා/නිලධාරිනියගේ නම, තනතුර, දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය